DOI: 10.31357/fhssmst.2009.00032

මාතෘකාව - ප්‍රචණ්ඩත්වය හා ජනමාධ්‍ය (රූපවාහිනියට අදාලව)

සම්පූර්ණ නම එන් එල් තුෂාරි ප්‍රියංගනි නාරම්පොල

ලියාපදිංචි අංකය GS/HU/1627/2002

විභාග අංකය MA/MC/0017

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජන සන්නිවේදන අධ්‍යයන අංශයේ

ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධිකාවයි

## අපේක්ෂකයාගේ ප්‍රකාශය

මේ ශාස්ත්‍රපති නිබන්ධය මා විසින් සම්පාදනය කරනලද බවත්, මේ ප්රයේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන් වශයෙන් හෝ වෙනත් විශ්ව විද්‍යාලයකට හෝ ආතයනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

30 NOV 2009

------------------------------------

අපේක්ෂකයාගේ අත්සන

# පිදුම

යහපත් පුරවැසියෙකු කරන්නට නිබඳ මා දිරිමත් කළ දයාබර මාපියන්ටත්

එකම සොයුරාටත්

# ස්තුතිය

මෙම නිබන්ධය සාර්ථක කර ගැනීම සඳහා ශිල්ප ඥානය ලබා දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජන සන්නිවේදන අධ්‍යයන අංශයේ සියලුම ඇදුරුතුමන්ලාටත්, මේ සඳහා තොරතුරු සොයා යාමේදී මා හට උපකාර කළ සැමටත්, ව/ගිරි / නුංගමුව දම්සෙන් මධ්‍ය මහා විද්‍යාලයේ ගරු විදුහල්පතිතුමා ඇතුලු දයාබර ආචාර්ය මණ්ඩලයටත්, සිසු දරු දැරියන්ටත්, පරිගණක අකුරු සම්පාදනයේදී මාහට මහත් සේ උපකාර කළ මා හිතවත් නාලනි සුභසිංහ සොයුරියටත්, මේ කාර්යයයේදි නන් අයුරින් සහයෝගය දැක්වූ මාගේ දෙමව්පියන්ටත්, දයාබර එකම සොයුරාටත් මාගේ ස්තුතිය පුදකර සිටිමි.

පටුන


| පරිච්ඡේදය | පිටුව |
| --- | --- |
| 1. හැඳින්වීම | 01-07 |
| 2. ප්‍රචණ්ඩත්වය යනු කුමක්ද | 08-13 |
| 3. ප්‍රචණ්ඩත්වය හා ළමා පරපුර | 14-36 |
| 4. ළමයින් සහ වීඩියෝ ක්‍රීඩාව | 37-41 |
| 5. සමාලෝචනය | 42-47 |
| 6. නිගමනය | 48-50 |

# හැඳින්වීම

රූපවාහිනිය යනු පිංතූර සහ ශබ්දය විකාශනය කිරීමේ විදුලි සංදේශන ක්‍රමයකි. රූපවාහිනිය හෙවත් Television යන්න ග්‍රීක හා ලතින් භාෂා දෙක එක් වීමෙන් සෑදුනකි. Tele යන්න ග්‍රීක භාෂාවෙන් දුර යන්න හැඳින්වීම සඳහාත් Vision යන්න ලතින් භාෂාවෙන් දැක්ම යන්නත් එක්වී Television (දුර සිදුවන දේ බලා සිටීමේ ක්‍රමය) යන්න සෑදී ඇත. එහෙත් බොහෝවිට Television යන්න කෙටි කර TV යන්න බහුලව ලෙස භාවිතාවේ.

රූපවාහිනිය දරුවන් කෙරෙහි කෙසේ බලපාන්නේදැයි යන්නට මාතෘකා කර ගනිමින් දියුණු රටවල සමාජ අධ්‍යාපනික විද්‍යාඥයින් ප්‍රයේෂණ හා අධ්‍යයනයන් සිදු කර ඇත. පසුගිය ගෙවුණු වසර පනහක් පමණ කාලය තුළ විශේෂයෙන්ම අපරදිග රටවල ජනතාවගේ හදවත් තුළට බලපෑ ප්‍රධානතම බහුජන මාධ්‍යය ලෙස රූපවාහිනිය පත්ව ඇත.

එක්සත් ජාතීන්ගේ සංවිධානය පෙන්වා දෙන පරිදි සාගින්න අවම කිරීම සඳහා විවිධ ඉලක්කයන් සපුරා ගත යුතුවේ. වසර 2015 දී දැනට ලොව සටිනා සාගින්නෙන් පෙළෙන්නන්ගේ සංඛ්‍යාව හරි අඩකින් අඩු කිරීමට නම් ලොව කෘෂිකර්මික හා ග්‍රාමීය අංශයේ වසරකට ඩොල්ර මිලියන 24 ක අමතර ආයෝජනයක් සිදුකළ යුතුවේ. එමෙන්ම කුසගින්නෙන් පෙළෙන්නන්ගේ මුලු සංඛ්‍යාවෙන් වසරකට මිලියන 22 ක් බැගින් අඩුවිය යුතුය. එහෙත් එක්සත් ජාතීන්ගේ වාර්තා පෙන්වා දෙන ආකාරයට වසරකට සාගින්නෙන් පෙළෙන ජනයාගෙන් අඩුවන්නේ මිලියන 6 ක් පමණි. විශේෂයෙන්ම අප දන්නා පරිදි විවිධ හේතූන් මත දිළිඳුකම අසරණකම මෙන්ම සමාජය විසින් නොසලකා හරින ලද බව නිසාම බොහෝ දරුවන් අධ්‍යාපනයට යොමුවීම පැහැර හරිනු ලැබ ඇත.

යුද්ධය හේතුවෙන් මියගිය දරුවන්ගේ ප්‍රමාණය ගත වූ දශක දෙක තුළදී ආසන්න වශයෙන් මිලියන 02 ක් පමණ යැයි ගණන් බලා ඇත. එමෙන්ම 90% ක් පමණ පිරිසක් අවි

ගැටුම්වලින් තුවාලවූ සිවිල් වැසියන් වන අතර එයින්ද බහුතරය කුඩා දරුවන් හා කාන්තාවන්වීමද මෙකී ව්‍යසනයට බලපෑ ප්‍රධානතම සාධකයකි.

එමෙන්ම ලොව බොහෝ රටවල දරුවන් දරිද්‍රතාවයේ හා ආහාර අහේනියේ ගිනිපෙත්තටම නැග ඇත. ලොව පුරා දරුවන් මිලියන 160 ක් පමණ මන්දපෝෂණයෙන් පෙළෙති. එමෙන්ම ලෝක ජනතාවගෙන් නිසියාකාරව ආහාර නොලැබෙන පිරිස දස ලක්ෂ 800 ක් පමණ යැයි ගණන් බලා ඇත. ඔවුන්ගෙන් 65% ක ජනතාව දකුණු ආසියාවට අයත් අතර අප්‍රිකානු උප සහරා ප්‍රදේශයේ මිලියන 220 ක් පමණ දරිද්‍රතාවයෙන් පෙළෙති.

මේ අතර තවත් බොහෝ දරුවන් අධ්‍යාත්මික දුගීභාවයෙන් ද පසුවෙති. මේ අතර ඔවුහු පාරිභෝගික ද්‍රව්‍ය මගින් මන්මත් කරවන අතර තාක්ෂණයේ දියුණුව හේතුවෙන් රූපවාහිනිය, පරිගණකය, වීඩියෝ යන්ත්‍රය විසින් ඉදිරිපත් කරනු ලබන දෘශ්‍යමය භාෂාව තුළට බලයෙන් ග්‍රහණය කර ගනී.

ඒවායෙහි අඩංගු හොඳ- නරක පවා අවබෝධ කර ගැනීමට දරුවන්ට ඉඩක් නොමැත. ඒවායෙහි හොඳ- නරක පවා අවබෝධ කර දීමට ද කිසිවෙකුත් නැති අතර දරුවන් හුදකලා කොට මෙවැනි ප්‍රචණ්ඩත්වය අඩංගු ද්‍රර්ශන රූපවාහිනිය මගින් ප්‍රචාරය කිරීම තුළින් ඔවුන් ඒවා එලෙසින්ම ග්‍රහණය කරගනු ඇත.

වත්මන් සමාජයේ දරුවන්හට කතා පවසන්නේ යන්ත්‍ර බැවින් ඒවා ඉදිරිපත් කිරීමෙන් දරුවන්ගේ අනාරක්ෂිතභාවයක් දක්නට ලැබේ. දරුවා ඒවායින් ලබා දෙනු ලබන හොඳ- නරක දෙකම නිරායාසයෙන්ම ග්‍රහණය කර ගනී.

චන්ද්‍රිකා තාක්ෂණයේ දියුණුවත් සමගම ඇති වූ විශ්ව ගම්මාන සංකල්පය ඉවතලමින් රටින් - රට දොරින් - දොර යාකරමින් සිදුවූ මෙම මහා තාක්ෂණික විප්ලවය මිනිස් චින්තකය නැංවීමට සමත්වූවාසේ ම එමගින් අත්වෙමින් පවතින සමාජ ප්‍රචණ්ඩත්වය පිළිබඳව ද ජාත්‍යන්තර අවධානය යොමවිය යුතුවේ.

යුරෝපය වැනි සංවර්ධනය වූ රටවල සෑම ගෙදරකම අවම වශයෙන් එක් රූපවාහිනී යන්ත්‍රයක් හෝ තිබේ. එසේම මෑතකදී කරන ලද සමීක්ෂණයකට අනුව ඇමෙරිකා එක්සත්

ජනපදයේ නිවෙස්වලින් 60% ට අවම වශයෙන් රූපවාහිනි යන්ත්‍ර 02 ක් හෝ ඊට වැඩි ගණනක් ඇති බවත් එක් ඇමෙරිකානුවෙක් එක් දිනකට පැය 4 ක කාලයක් රූපවාහිනිය ඉදිරියේ ගත කරන බවත් අනාවරණය වී ඇත.

එමෙන්ම දියුණු වෙමින් පවතින "සයර්රෙ රාජ්‍යයේ" මිලියන 30 වැඩි ජනගහනයක් වෙසෙන අතර වසර 2,000 වන විට පවා රූපවාහිනි යන්ත්‍ර 20,000 ක් වැනි ප්‍රමාණයක් පමණක් භාවිතා වී ඇත. මේ තත්වය දියුණු රටවල් හා සැසඳීමේදි ඉතා අසතුටුදායක තත්වයකි.

එමෙන්ම තම නිවසේ සිටම දැනුම, විනෝදය අධ්‍යාපනය ලබා ගැනිමට ජනතාවට රූපවාහිනිය මගින් අවස්ථාව උදාවී ඇත. එසේ වුවද රූපවාහිනි වැඩසටහන්වල පවත්නා ගුණාත්මකභාවය පිළිබඳව පැන නැගී ඇති ගැටලුව හේතුවෙන් සමාජය තුළ විවිධ ව්‍යාකූල අවස්ථාවන් මෙන්ම විවිධ සමාජ ව්‍යසනයන්, විශේෂයෙන්ම ප්‍රචණ්ඩකාරීත්වයන්ද උද්ගතවී ඇති බවත් බොහෝ සමාජ විද්‍යාඥයින් පෙන්වා දි තිබේ.

එමෙන්ම ලොව බොහෝ රටවල කුඩා දරුවන් දවසේ වැඩිම වේලාවක් වැය කරනු ලබන්නේ රූපවාහිනිය නැරඹීමට බවද ඔවුන් පෙන්වා දි ඇත. ඒ අනුව රූපවාහිනිය නැරඹීමේ වත්මන් ප්‍රවණතාව දිගින් දිගටම පැවතුනහොත් දරුවන් නිදා ගැනිම හැරුණුවිට ඔහුගේ ජිවිතේ වැඩි කාලයක් වෙන් කර ඇත්තේ රූපවාහිනිය නැරඹීමට බව සමාජ විද්‍යාඥයින් වැඩි දුරටත් පෙන්වා දි ඇත.[1]

ඒ අනුව රූපවාහිනිය මගින් කොතෙක් දුරට සමාජයට බලපෑම් කෙර්රෙද යන්න බටහිර රටවල විවිධ ප්රයේෂණයන් සිදුකරමින් පවතී. විශේෂයෙන්ම ප්‍රචණ්ඩත්වය කෙරෙහි රූපවාහිනියෙහි බලපෑම පිළිබඳව ද විවිධ ප්රයේෂණ සිදුවෙමින් පවති.

රූපවාහිනිය දරුවන්ගේ ඉගෙනුමට පාසලක් වුයේද නැතිනම් බාධාවක් වුයේද යන්න විමසිය යුතුවේ. එමෙන්ම දරුවන්ට රූපවාහිනිය නැරඹීමට ඉඩදිය යුතු ද යන්න බොහෝ දෙනෙකුගේ විග්‍රහයට භාජනය වී ඇත. ඒ සම්බන්ධයෙන් මත පළකරමින් බොහෝ දෙනෙකු පවසන්නේ

1 Giddens, anthony, 1999, Sociology Cambridge, The Polity Press

රූපවාහිනිය නැරඹීම හේතුවෙන් දරුවන් හිංසාකාරී , වංචනික හා ලිංගික ක්‍රියාවන්ට යොමුවීමේ වැඩි ප්‍රවණතාවයක් ඇති බවයි.

එහෙත් ඇතැමෙක් පවසන්නේ රූපවාහිනිය මගින් අධ්‍යාපනික හා ළමා වැඩසටහන් ප්‍රචාරය වන අතර එමගින්ද දරුවන්ගේ දැනීම හා බුද්ධිය වර්ධනය වන බවත්ය. ඒ අනුව රූපවාහිනිය සත්‍ය වශයෙන්ම දරුවන්ට යහපතක්ම වන්නේද යන්න විමසිය යුතුවේ.

රූපවාහිනිය නිවසට තොරතුරු, දැනුම, අධ්‍යාපනය, විනෝදාස්වාදය ද රැගෙන එන අතරතුර ම ප්‍රචණ්ඩත්වයද හොර රහසේම රැගෙනවිත් මනස තුළ විකෘති ස්වභාවයක් ඇති කිරීමට සමත්වේ. ඒ අනුව රූපවාහිනී ප්‍රචණ්ඩත්වයේ බලපෑමට දරුවන් ඉතා පහසුවෙන් ගොදුරුවෙති.

එමෙන්ම තෙවැනි ලොව රටවල් තුළ රූපවාහිනී ප්‍රචාරය වූ මුල් කාලයේ එයින් ආලින්දයට ගෙනෙනු ලැබූයේ බටහිර රටවලින් ආනයනය කරන ලද පහත් පෙළේ ගොපලු චිත්‍රපට හා අසංයත ටෙලිනාට්‍යයයි. මේවා මගින් නවීන ඇඳුම් විලාසතා, යෞවනයේ නිදහස්බව, ලිංගිකත්වය, වීරත්වය යනාදිය අදාල දේශයේ සංස්කෘතියට හා සමාජ ක්‍රමයට ප්‍රබල ලෙස බලපෑම් කර ඇත. ඒ අනුව පහත් පෙළේ චිත්‍රපට තුළින් මතුවූ අසම්මත ලිංගික ක්‍රියා, අමානුෂික පහරදීම්, අසම්මත හැසිරීම්, පැවතුම් හා ප්‍රණ්ඩත්වය ද ළමා මනස තුළ දැඩි කැළඹීමක් ඇති කිරීමට සමත්වූ බැව් පෙන්වා දිය හැකිය.

දෙමාපියන් සෙවනෙහි දරුවන්ගේ බාල කාලය වැඩීයාමට අවශ්‍ය වුවද බොහෝ දෙමව්පියන් රැකියා සඳහා යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන් දරුවන්ගෙන් වෙන්ව වැඩි කාලයක් ගත කිරීම හේතුවෙන් දරුවන් රූපවාහිනියට දැඩි ලෙස ළංවූහ.

ඒ අනුව රූපවාහිනිය විශ්ව සමාජය කරා කුඩා දරුවන් ගෙන යන ප්‍රබල වාහකයන් බවට පත්විය. ළමා පරපුර දැනුම්වත් කිරීම, චරිත සංවර්ධනය, පෞරුෂය වර්ධනය, ආකල්ප වර්ධනය උදෙසා රූපවාහිනියෙන් ඉටු කළ හැකි මෙහෙවර අපමණයි. මෙකී සියලු කාර්යයන් අධ්‍යාපනික රූපවාහිනිය මගින් ඉටුකළ හැකිය. එහෙත් නූතන සමාජය තුළ භාවිතා වන්නේ හුදු විනෝදය පමණක් කැටිකරගත් විනෝදාත්මක රූපවාහිනියකි.

ප්‍රයේෂණ මාතෘකාව

රූපවාහිනි ප්‍රචණ්ඩත්වය හා ළමා මනස

පර්යේෂණ ගැටලුව

ප්‍රයේෂණ ගැටලුව වන්නේ රූපවාහිනි ප්‍රචණ්ඩත්වය හේතුවෙන් ළමයින්ට වන බලපෑම යන්නයි. මෙහිදි රූපවාහිනි ප්‍රචණ්ඩ ද්‍රශන ඉදිරිපත් කිරීම හේතුවෙන් කුඩා දරුවන් තුළ කොතෙක් දුරට ප්‍රචණ්ඩකාරී හැඟීම් උද්ගතවේද, ඒවා ඔවුන්ගේ මනසේ ක්‍රියාකාරීත්වයට බලපාන්නේ කෙසේද, ද්‍රශන නැරඹීම හේතුවෙන් මතු අනාගතයේදී ළමා මනසෙහි වර්ධනය වන සිතුවිලි, හැගිම්, ආකල්ප, චර්යා රටාවන් පිළිබඳව කුමන තත්වයක් ඇතිවේද යනාදී වශයෙන් ගැටලු රාශියකට මුහුණදීමට සිදුවේ.

පර්යේෂණ ක්‍රමවේදය

රූපවාහිනි මාධ්‍ය පිළිබඳව අප සමාජය තුළ ලියැවී ඇති ග්‍රන්ථ ප්‍රමාණය ඉතාම සීමිතය. ඒ අතුරින්ද රූපවාහිනි ප්‍රචණ්ඩත්වය ළමුන්ට බලපාන අයුරු පිළිබඳව ලියැවී ඇති වාර්තා අඩු බැවින් තොරතුරු රැස් කර ගැනිම ඉතාමත් අසීරු කරුණක් විය. මන්ද යත් රූපවාහිනිය අප සමාජයට අවතීර්ණවී වසර 30 පමණ කාලයක් ගෙවී ගියද එය තවමත් ආගන්තුක භාණ්ඩයක් දැයි යන සැකයක්ද මෙහිදී ඇති විය. ඊට ප්‍රධාන හේතුවක් ලෙස මාහට අවබෝධ වූයේ විදේශීය රටවල් රූපවාහිනි මාධ්‍ය පරිහරණයේදී දක්වනු ලබන දැඩි ප්‍රවණතාවය ලාංකීය සමාජය තුළදි දක්නට නොලැබීමයි.

එමෙන්ම විදේශිය රටවල රූපවාහිනය භාවිතය හා සැසඳීමේදි පෙනීයන්නේ ලාංකීය සමාජය තුළ කුඩා දරුවන් විදේශීය දරුවන් පමණටම රූපවාහිනයට ඇබ්බැහිවී නොමැති බවත්, තවමත් ශ්‍රී ලාංකීය සංස්කෘතික අනන්‍යතාවය තරමක්දුරට හෝ සුරැකී තිබීමත් මේ සඳහා බොහෝවිට හේතුවන බවයි. එමෙන්ම ලාංකීය සමාජය තුළ මෙම ගැටලුවට දෙමව්පියන්ගේ මැදිහත්වීමද ඉතා ඉහළ මට්ටමක පවතින බවත් ඉහත අධ්‍යයනයේදී අවධාරණය විය.

මෙහිදී මා යොදාගත් ප්‍රර්යේෂණ ක්‍රමවේදය වන්නේ රූපවාහිනී මාධ්‍ය පිළිබඳව ලියැවී ඇති විද්වත් ග්‍රන්ථ පරිහරණය, සන්නිවේදන විෂයට අදාලව පුස්තකාල පොත් පරිශීලනය, සඟරා, ප්‍රවෘත්ති පත්‍ර, බැංකු තොරතුරු ලබා ගැනිම, රජයේ හා විවිධ ආයතවන විසින් නිකුත් කරනු ලැබූ වාර්ෂික වාර්තා, ප්‍රරයේෂකයන් විසින් හෝ විශ්ව විද්‍යාල ප්‍රරයේෂණ ආයතන විසින් හෝ ඒකරාශි කර ඇති තොරතුරු මෙන්ම World Development Report, Unesco වැනි ජාත්‍යන්තර ආයතන විසින් ප්‍රකාශයට පත් කරන ලද වාර්තා වැනි ද්විතීයික දත්ත මූලාශ්‍ර මෙන්ම ද්විතියික දත්ත ලබාගැනිමේ නවතම ක්‍රමය වන අන්ත්‍රර්ජාලය - Internet මගින් ලබා ගත් තොරතුරු යනාදියයි.

අන්ත්‍රර්ජාලය- Internet හරහා මේ සඳහා විශාල වශයෙන් තොරතුරු ලබා ගන්නා ලදී. මෙම අධ්‍යයනයේදී ඊට ප්‍රධාන හේතුවක් වූයේ රූපවාහිනී ප්‍රචණ්ඩත්වය පිළිබඳව ලාංකීය සමාජය තුළ ඉතා උසස් මට්ටමින් ප්‍රරයේෂණයන් සිදු කර නොතිබීමයි.

මෙහිදී මාගේ ඉලක්ක කණ්ඩායම - Target Group වුයේ අලව්ව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ව/ගිරි/ නුංගමුව දම්සෙන් මධ්‍ය මහා විද්‍යාලයේ 5 වසරෙහි සිට 12 වසර දක්වා ඉගෙනුම ලබන පාසල් දරුවන් වන අතර ඔවුන්ව අහඹු ලෙස එම කාණ්ඩය සඳහා තෝරා ගන්නා ලදි.

ඔවුන්ගෙන් 5 වසරෙහි දරුවන්ගෙන් 45 % ක් කාටූන් වැඩසටහන් නරඹති. උදෑසන අවදි වූ සැනින්ම ඔවුන් වහා රූපවාහිනිය වෙත දිව යන බවත්, තමා විසින්ම එය පණ ගන්වන බවත් පවසන ලදි. සිය දෙමව්පියන්ගේ අනු දැනුමකින් තොරව මොවුන් රූපවාහිනී යන්ත්‍ර පනගන්වනු ලබන අතර නාලිකා මාරු කිරීමද ඔවුන් විසින්ම සිදු කරනු ලබයි. එමෙන්ම එම කාටූන් වැඩසටහන් ඔවුන් වඩාත්ම කැමැත්තක් දක්වන වැඩසටහන් බවද පවසන ලදි. අහඹු ලෙස තෝරා ගත් දරුවන්ගෙන් අධ්‍යාපනික වැඩසටහන් නරඹන ප්‍රතිශතය 20 % කි. ඔවුන් 10 වසරෙහි අධ්‍යාපනය හදාරන්නන් විය. සංගීතමය වැඩසටහන් නරඹන ප්‍රතිශතය 10 % කි. නාට්‍යමය වැඩසටහන් නරඹන්නන් ප්‍රමාණය 15% කි. මෙහිදී පෙනී ගියේ මොවුන්ගෙන් වැඩි ප්‍රතිශතයක් කාටූන් වැඩසටහන් නැරඹීමට මහත් කැමැත්තක් දක්වන බවයි.

මෙහිදි ප්‍රාථමික දත්ත ඒකරාශි කිරීමේදි බහුලව යොදා ගන්නා ලද ක්‍රමයක් වන ප්‍රශ්නමාලා ඇසුරින් ප්‍රශ්න ඇසීම හෙවත් Questionnaire ඇසුරින් තොරතුරු ලබා ගැනිම සිදු කරන ලදි. එනම් ප්‍රශ්න මාලාව ප්‍රතිග්‍රාහකයාට ලබාදී එවේලේම තොරතුරු ලබා ගැනීමයි. මෙහි සුවිශේෂත්වය වන්නේ තොරා ගත් නියැදිය වෙත ප්‍රශ්නාවලිය තැපැල් මගින් නොයවා පෞද්ගලිකවම ලබාදීමයි. ඔවුන් විසින්ම පිළිතුරු සපයා එම පිළිතුරු පත් නැවත ලබා ගතිමි.

ප්‍රශ්නාවලිය නැවත ලබා ගැනීමේදී ද ප්‍රතිග්‍රාහකයින් හමුවීමට ද ඔවුන් සමග කතා කිරීමට ද හැකි විය. එමෙන්ම සංඛ්‍යාත්මක වටිනාකම් ඇසුරින් දැක්විය හැකි ප්‍රමාණාත්මක දත්තයන්ද මෙහිදි යොදා ගන්නා ලදි.

එමෙන්ම සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් තොරතුරු ලබා ගැනිමේ ක්‍රමයද මෙහිදී අනුගමනය තරන ලදි. ඒ සඳහා අහඹු ලෙස තෝරාගත් දෙමාපියන් (කුඩා දරුවන් සිඹනා) සම්මුඛ සාකච්ඡාවට ලක් කරන ලදි. ඔවුන්ගේ සාකච්ඡා ඇසුරින් ලබා ගත් නිගමනය වූයේ කුඩා දරුවන් රූපවාහිනිය ප්‍රචණ්ඩත්වයට නැඹුරුවීම නවතාලිය නොහැකි බවයි.

කුඩා දරුවන් ඔවුන් විසින්ම රූපවාහිනිය පණ ගන්වා රිමෝටරය භාවිතයෙන් තමන් කැමැති නාලිකාව තෝරා ගැනීම සිදු කරනු ලබන බවත් ඔවුන්ගේ දෙමාපියන් පවසන ලදි. එමෙන්ම කේබල් රූපවාහිනී ක්‍රමය ලොව පුරා ව්‍යාප්තවීමත් සමගම ලොව පුරා විහිදී ඇති රූපවාහිනී නාලිකා සිය ගණනක් අප රටේදී නැරඹිය හැකි බැවින් ඔවුන් ඒවායින් මුදවා ගැනීමේ ක්‍රමයක් දෙමාපියන්ට නොමැති බවත්, එම නාලිකා තුළින් අප වෙත දෙනු ලබන හරසුන්, ප්‍රචණ්ඩකාරී දසුන් නැරඹීම හේතු කොට ගෙන තම දරුවන් ඉන් මුදවා ගැනීම මහත් අසීරු කාර්යයක් වී ඇති බවත් ඔවුන් විසින් පෙන්වා දෙන ලදි.

මේ හේතුවෙන් ළමුන් තම පාසල් කටයුතු අතපසු කරගන්නා බවත්, අසංවර ඇඳුම් විලාසිතා විවිධාකාර ඇඳුම විලාශයන්, විවිධ මෝස්තර වැනි දේ මෙන්ම විවිධ වු භාෂාවන් ට හුරුවීමද නවතාලිය නොහැකි බවත්, මේ හෙයින් දෙමව්පියන් වශයෙන් ඔවුන් තම දරුවන් මේ තත්වයෙන් මුදවා ගැනිම සඳහා මහත් අසීරුතාවයකට පත්ව ඇති බවත් පවසන ලදි.

# ප්‍රචණ්ඩත්වය යනු කුමක්ද ?

ප්‍රචණ්ඩත්වය හෙවත් Vilonce යනු නූතන සමාජ ව්‍යුහය තුළ ගැටුම් නිරාකරණය කර ගැනීම සඳහා බහුලව යොදා ගන්නා උපක්‍රමයකි. ප්‍රචණ්ඩත්වය මූලික වශයෙන් දෙදෙනෙක් අතරේ මෙන්ම ප්‍රදේශ, කලාප, විවිධ සංස්කෘතීන්, වයස් මට්ටම්, අධ්‍යාපන මට්ටම් දක්වා සමාජමය විකාශනයක් බවට පත්විය හැක. එමෙන්ම එකිනෙකා තුළ පවතින අභ්‍යන්තර ප්‍රතිවිරෝධයන් ද එය ප්‍රචණ්ඩත්වය කෙරෙහි බලපෑම් කරනු ලබයි.

ප්‍රචණ්ඩත්වය විවිධ ප්‍රවේශයන් ඔස්සේ අප සමාජයේ දක්නට ලැබේ. ආගම, පංති වෛරය, ව්ර්ගිකත්වය, ලිංගිකත්වය, දේශපාලන දරිද්‍රතාවය හා අසාධාරණය වැනි කාරණාවලදී ප්‍රචණ්ඩත්වය බොහෝ සෙයින් මතුවී පෙනේ. ලොව පුරා ප්‍රචණ්ඩත්වය වීරධනය වෙමින් පවති. ප්‍රචණ්ඩත්වය යන්න සුදුසු නිරවචනයක් සොයා ගැනිම ඉතා වැදගත්වේ.

ප්‍රචණ්ඩත්වය යනු දූෂණය, මිනී මැරුම හෝ බලහත්කාරය වැනි ක්‍රියාවක්ද යන්න විමසිය යුතුවේ. ප්‍රචණ්ඩ ද්රශනයක් යනු අපරාධී ක්‍රියාවක් සහිත ද්රශනයකි. එය නරඹන්නන්ට උසුලාගත නොහැකි, විඳ දරා ගත නොහැකි ආකාරයේ ඕනෑම අවස්ථාවක් ඉදිරිපත් කිරීමක් විය හැකිය.

R.E. Allen නැමැති චින්තකයා "ප්‍රචණ්ඩත්වය - Violence" යනු අයුතු භාවිතාවක් හෝ ශාරීරික බලපැමක් ලෙස "Oxford Dictionary" හි දක්වා ඇත. එය රටක හෝ භූමි ප්‍රදේශයක පවතින නීතියට හෝ ධ්රමතාවලට පටහැනි ලෙස පුද්ගලයෙකු, පුද්ගල සමූහයක් විසින් කරන අයුතු භාවිතාවක් හෝ ශාරීරික බලපැමක් විය හැකි බව එම ශබ්දකෝෂයේ තව දුරටත් සඳහන්වේ.[2]

16 වැනි සියවසෙහි ඉතාලියේ පිවත්වූ දේශපාලන චින්තකයෙකු වු "මැකිවෙල්ලි" දක්වා ඇත්තේ" ප්‍රචණ්ඩත්වය යනු කුරිරුකම හොඳින් හෝ නරකින් හෝ පාවිච්චි කිරීම යනුවෙනි.[3]

---

2 A R.E. Allen *- The Concise Oxferd Dictionery of Current English, Delhi Oxferd University press, Madrass-1270 p.

3 ගැටුම් නිරාකරණය කිරීම් මාධ්‍ය සහ සාමය ගොඩනැගිමේවම් ජයදේව උයන්ගොඩ විකශ්ගනා ල්ප අධ්‍යයන කේන්ද්‍රය සමාජවිද්‍යාඥයිනිගේ සංගමය 2003 ව

සමාජ මනෝ විද්‍යාවට අනුව ප්‍රචණ්ඩත්වය යනු පුද්ගලයෙකුගේ හෝ පුද්ගල කණ්ඩායමක අයුතු බලපෑමක් හෝ සමාජ අපචාරයක්වේ.

මාධ්‍යයක් මගින් ග්‍රාහක මනස හා චර්යාවන් හිංසාකාරී හෝ අමානුෂික ක්‍රියාවන්ට යොමු කරවීම මෙය විශේෂයෙන් දෘශ්‍ය මාධ්‍ය ඔස්සේ සිදුකෙරෙන බව පෙනියයි. අතිශය හිංසාකාරී ජවනිකා මගින් බිහිවන දෙය ප්‍රචණ්ඩතාව ලෙස සැලකේ.[4]

ඒ අනුව විමසීමේදී ප්‍රචණ්ඩත්වය යනු නිතිමය වශයෙන් හා සමාජමය වශයෙන් යහපත් යැයි පිළිගත් මතයන්ට පටහැනිව පුද්ගලයෙකුගේ හෝ පුද්ගල කණ්ඩායමකගේ සමාජ විරෝධී හැසිරීමක් ලෙස හඳුන්වා දිය හැකිය. එමෙන්ම ප්‍රචණ්ඩත්වය මිනිස් සමාජයේ විවිධාකාරයෙන් උත්සන්න වන මතභේදයන් ජය ගැනීමට යොදා ගන්නා අවසාන විසඳුම බවටද පත්ව ඇත.

නොදියුණු තත්වයේ පසුවූ මිනිසා දියුණු ශිෂ්ටාචාරයන්ට ප්‍රවිශ්ටවීමට ම්ලේච්ඡ යුගයේ සිට නූතන තාක්ෂණික අවධිය තෙක් දිගු ගමනක් පැමිණියද ඔහුගේ ගති සිරිත් තුළින් ප්‍රචණ්ඩත්වය බැහැර වුයේ යැයි කිව නොහැක.

යුනෙස්කෝ ප්‍රඥප්තිය මගින් අවධාරණය කර ඇති ආකාරයට මිනිසා අතර සැකය හා අවිශ්වාසය හේතුවෙන් ද අන්‍යෝන්‍ය ගෞරවය, සමානත්වය, ප්‍රජාතන්ත්‍රවාදි ප්‍රතිපත්ති යනාදිය ප්‍රතික්ෂේපවීම හේතුවෙන්ද ප්‍රචණ්ඩත්වය මිනිස් මනස තුළ උපදි.

මේ සඳහා විවිධ හේතු සාධකයන් පවතී. එමෙන්ම එය එක් අංශයක් තුළ පමණක් සිදුවන්නක් යැයි කිව නොහැකිය. එමෙන්ම එයින් සමාජයට අත්වන බලපෑමද විවිධාකාරය. ඒ අනුව 21 වැනි සියවස තුළ සිදුවූ තාක්ෂණික විලප්ලවයද ප්‍රචණ්ඩත්වයට එල්ල වු ප්‍රබල අවියකි.

ඒ අනුව මෙම දැවැන්ත තාක්ෂණිකමය විලප්ලවය හේතුවෙන් මා්රෂල් මැක්ලුහන් Marshall Mac Luhan නැමැති කැනේඩියානු විද්‍යාඥයා පෙන්වා දුන් Global Village සැබෑවක් බවට පත්වෙමින්, ආචා්රය ආත්ර සි ක්ලා්රක් විද්‍යාඥඥයා පෙන්වා දුන් ආකාරයට එය තවදුරටත්

4 ඔජේන්ද්‍ර සුහන්ද සන්නිවේදන ශබ්දාකරය 1997 චතුර මුද්‍රණ ශිල්පියෝ 142 අවිස්සාවේල්ල පාර වැලිලම්පිටිය 328 පිටුවඩ

කුඩා වී විශ්ව පවුලක් Global family බවටද, ඉන් නොනැවතී තව දුරටත් ඉදිරියට ගොස් Tele Family බවටද පත්වීමත් සමගම විද්‍යුත් මාධ්‍ය විසින් සමාජය සංකීර්ණ වී මිනිසුන් තොරතුරු සුපිරි මාවතේ – Information Super Highway මං මුලා කරවන තත්වයකට පත්ව සිටී. මෙම සංකීර්ණ සමාජය තුළ මිනිසුන් වානිජකරණයට ගොදුරුව ඇති අතර ඔවුන්ගේ හැඩ ගැමස්මද ශීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවති. ඒ අනුව වත්මන් දරුවාගේ අවබෝධයද, විෂය පථයද මෙම දැවැන්ත විශ්මය සමගම පුලුල්වී ඇති අතර දරුවන් මාධ්‍ය භාවිතයට බෙහෙවින් නැඹුරුවී ඇත.

මේ අනුව රූපවාහිනිය ප්‍රචණ්ඩත්වයට නැඹුරුවීම දරුවන්ගේ දැනුමට, සාරධර්ම වැඩීමට මහත් රුකුලක් වනවා සේම දරුවාගේ පසුගාමීත්වයට හා ඔහු සංකීර්ණ සමාජ රටාවේ ගොදුරක්බවට පත්වීමටද ඉවහල්වන බව ද විද්‍යාඥයින් විසින් පෙන්වා දී ඇත .

යුනෙස්තෝ අධ්‍යක්ෂ ජනරාල්වරෙයෙකු වූ " අමදෝ මාතා්ර එම්බෝ " වරක් පවසා සිටියේ නිදහසේ මල්පල ගැන්වීමටත්, ජාතීන් අතර අන්‍යෝන්‍ය සහයෝගය මෙන්ම ආ්ර්ථික සබඳතා සඳහාත්, ඔවුන් අතර ගෞරවය වි්රධනයවීමටත්, සමාජ ප්‍රගතිය සඳහාත් සන්නිවේදන මාධ්‍යන් වැඩි වැඩියෙන් උපයෝගි කරගත හැකියි යනුවෙනි.

එමෙන්ම වත්මන් සමාජය දැනුම පුපුරාගිය යුගයකට අවතීරණවී ඇති අතර එහිදීද විද්‍යුත් මාධ්‍යයන් ලෙස ගැනෙන රූපවාහිනි මාධ්‍යයට සුවිශේෂී ස්ථානයක් හිමිවේ. රූපපවාහිනිය අවිධිමත් අධ්‍යාපන මාධ්‍යයක් වන අතර විද්වතුන් එය තෙවැනි ගුරුන් ලෙසද හඳුන්වාදී ඇත.

රූපවාහිනියේ රූප රාමු පෙළ ගැසීමේ රටාවට සාපේක්ෂව පොත් පත් කියවීමෙන් හෝ යම් අයෙකුට සජීවී ලෙස සවන්දීමේදී මෙන් අසන්නාගේ දැනුවත්කම, බුද්ධිය වැඩි නොවන බවද ජනමාධ්‍ය විශාරදයින් හා මනෝ විද්‍යාඥයින් පෙන්වා දී ඇත. එමෙන්ම රූපවාහිනියට නතුවූ ග්‍රාහකයින් අතර කුඩා දරුවන් හා කාන්තාවන් ද ප්‍රබල ලෙස ප්‍රචණ්ඩත්වයට හසුවන අවස්ථා ඇත.

නවීනලෝකය ඒ අයුරින්ම දැකගැනිමට හැකිවීම නිසා කුඩා ළමුන් වැඩි වශයෙන් ම රූපවාහිනිය නැරඹීමට ප්‍රිය කරන බවත් විද්‍යාඥයින් පෙන්වා දි ඇත. රූපවාහිනිය තෙවැනි ගුරුන්ගේ Third Parent ස්ථානයේ වැජඹුනද එමගින් දරුවන්ට හා කාන්තාවන්ට හිංසාකාරී වංචනික හා ලිංගික